කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

## සිංහල භාෂාව හා සාහිත්‍යය

10 ශ්‍රේණිය    කාලය පැය 2 යි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 -3 දක්වා ප්‍රශ්නවල ඉරිගසා ඇති කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය තෝරන්න.

01) සේතං මුදලාලි පොල් ඉඩම මිල දී ගැනීමට කැසකවනවා යැයි තාත්තා පැවසුවේ ය.

i. මුදල් හොයනවා    iii. තොරතුරු හොයනවා

ii. සූදානම් වෙනවා    iv. අත්තිකාරම් දෙනවා

02) වෙදදුරුතුමා සිංහල වෛද්‍ය ක්‍රමය අතැඹුලක් සේ දන්නේ යැයි මිනිස්සු පවසති.

i. අධ්‍යයනය කර    iii. තක්සේරු කර

ii. ඉතා හොඳින් දැන අවබෝධ කර    iv. මුළුමනින්ම

03) සමාජයේ යහපත සඳහා හරුබස්ම ම කැප කිරීමට ඔහු සිතා ගත්තේ ය.

i. ඉඩ කඩම් සියල්ලම    iii. සියලු සැප සම්පත් ම

ii. සියලු ම දේ    iv. සියලු වස්ත්‍රාභරණ ම

- අංක 4 - 8 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

04) සභාතුමු සතුටින් විසිර ...............

i. ගියහ    iii. යන්නී ය

ii. ගියා ය    iv. ගියෙහු

05) එම උත්සවයේ දී මිනිසුන් විසින් විවිධ අදහස් ප්‍රකාශ ..............

i. කළෝ ය    iii. කළේ ය

ii. කරන ලදී    iv. කරන ලදහ

06) ලබන මාසයේ විදේශ සංචාරයක යෙදෙන බව පියාණෝ ........................

i. පැවසුවේ ය.    iii. පවසන ලදී

ii. පැවසූහ    iv. පවසන ලදහ

07) වස්තුහිමියෝ තව තවත් ධනය රැස් ...................

i. කරති    iii. කළේ ය

ii. කරයි    iv. කරන්නේ ය

The National e-learning Portal for The General Education

08) ඒ භයානක දර්ශනය දුටුවන්ගේ සිත් කම්පනය ..........

i. වූහ

ii. විය

iii. වූවා ය

iv. කළේ ය

- හිස්තැන් පිරවීමට සුදුසු උත්තරය තෝරන්න.

09) ප්‍රථම පුරුෂ බහුවචන වර්තමාන ආඛ්‍යාතයකට උදාහරණයකි............... යන්න.

i. කැඩෙති

ii. කැඩෙයි

iii. කැඩිණි

iv. කැඩුණෝය

10) මධ්‍යම පුරුෂ ඒක වචන වර්තමාන කාල ආඛ්‍යාතයකි. ......................

i. ගියෙහු

ii. යන්නෙහි

iii. ගියහ

iv. ගියෙහි

- ඉරිගසා ඇති පදවල නිවැරදි ව්‍යාකරණ වර්ගය තෝරන්න.

11) නංගී <u>ශෛලමය</u> බුදු පිළිමය දෙස එක එල්ලේ බලා සිටියා ය.

i. කෘදන්ත

ii. තද්ධිත

iii. සන්ධි

iv. උපසර්ග

12) දිනපතා <u>ව්‍යායාම කරද්දී</u> ශරීර සෞඛ්‍ය යහපත් වේ.

i. අසම්භාව්‍ය ක්‍රියා

ii. ප්‍රයෝජ්‍ය ක්‍රියා

iii. මිශ්‍ර ක්‍රියා

iv. විධි ක්‍රියා

- වරහන් තුළ ඇති වචනවලින් තුනක් සමානාර්ථවත් ය. නොගැළපෙන වචනය තෝරන්න.

13) 1. අනංගයා 2. මද රද 3. මල්සරා 4. වෙලෙවි

14) 1. බරණිඳු 2. ඊශ්වර 3. භූපති 4. ඉසුරු

15) 1. දියනෙත 2. කලාපති 3. පිනිපා 4. දිනිඳු

- අංක 16 - 17 ප්‍රශ්නවල ගැළපෙන විරුද්ධ පද යුගලය යටින් ඉරක් අඳින්න.

16) 1. සංයෝග - සුසංයෝග 2. ආයාස - නිරායාස 3. යත්න - වියත්න 4. ආකූල - ව්‍යාකූල

17) 1. අවතීර්ණ - විස්තීර්ණ 2. පුත්‍ර - දුහිතෘ 3. විරල - සරල 4. සතුරු - පිළිමල්

- එක් එක් යෙදුම වෙනුවට යෙදිය හැකි තනි පදය තෝරන්න.

18) කෙනෙකුගෙන් තවත් කෙනෙකුට පරපුරෙන් උරුම වන දේ.

i. දායාදය  
ii. ප්‍රවේණිය  
iii. අයිතිය  
iv. භාග්‍ය

19) එකම කාලයක දී පැවතුන

i. සර්වකාලීන  
ii. දීර්ගකාලීන  
iii. සමකාලීන  
iv. සියලුකාලීන

20) සිතින් මවාගත්

i. මනඃකල්පිත  
ii. මනෝමූලික  
iii. මනස්කාන්ත  
iv. අයස්කාන්ත

(ලකුණු 2 x 20=40)

02) පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

නිල් වරලේ බැඳි මල් ඔටුනු ඉස දෑ රෑ  
රන් උපුලේ මල්කඩිනු දුළ පිවිතු රෑ  
සඳතකුලේ පරසතු ලවග කහයු රෑ  
ලුවකමලේ සුවඳට බමරු පිරිවැ රෑ

1. මෙහි මුල් පද පේළියේ තේරුම ලියන්න.
2. කවියේ සඳහන් මල් වර්ග දෙකක් අඳහන් කරන්න.
3. බමරු පිරි සිටියේ කුමක් නිසාද ?
4. කවියේ සඳහන් රූපකයක් ලියා දක්වන්න.
5. පිවිතුරු  
   සුවඳ යන පදවලට සමාන පද ලියන්න.

(ලකුණු 10)

03) ඔබගේ ප්‍රදේශයේ සිංහල අලුත් අවුරුදු උත්සවය 2016-04-05 වන දින පැවැත්වේ. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අඹතලේ මහා විද්‍යාලයේ විදුහල්පතිතුමාට ආරාධනය කරමින් යවන ආරාධනා පත්‍රය සකස් කරන්න.

(ලකුණු 10)

## 2 - කොටස

## සාහිත්‍යය

- පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

01)

i. පන්සිය පනස් ජාතකය ලියවුණේ කුමන යුගයේ ද ?

ii. එකල රජකළ රජතුමා කවුද ?

iii. පන්සිය පනස් ජාතකය ලිවීමට අනුග්‍රහය දැක්වූයේ කවුද ?

iv. එම ජාතක පොත ලිවීමට මූලාශ්‍ර කරගත් කථාව කුමක්ද ?

v. සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතික ලක්ෂණ මොනවාද ?

vi. වෙන් වෙන් වශයෙන් ලියවුණු ජාතක කතා දෙකක නම් ලියන්න.

vii. ජාතක කතා ඇසුරෙන් ලියවුණු ගී කාව්‍ය තුනක් ලියන්න.

viii. ජාතක පොත ඇසුරෙන් බිහි වූ කාව්‍ය ග්‍රන්ථ තුනක් ලියන්න.

ix. උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ කුමක්ද ?

x. පන්සි පනස් ජාතකය ලියවුණේ කුමන සියවසේ ද ?

xi. ඔබට නියමිත පාඩමට අදාළ ව ඇත්තේ උම්මග්ග ජාතකයේ කවර කොටස් ද ? (ලකුණු 20)

02) පහත අවස්ථා හා සිද්ධි සඳහා කෙටි පිළිතුරු සපයන්න.

i. ''දේවයන් වහන්ස, ඇතුළු නුවරදී රහස් කියන්නට නොපිළිවන''

අ) මෙය ප්‍රකාශ කළේ කවුද ?

ආ) රහස කීමට ගිය ස්ථානය කුමක්ද ?

ii. ''නැවත අටකනකට ගොස් පසුව සිය කනකට යන්නේ යැ''

අ) ප්‍රකාශකයා කවුද ?

ආ) එසේ ප්‍රකාශකර ගියේ කොහේට ද ?

03) ''අපි මියළු නුවර රාජ්‍ය ගෙන ම ජය පානය බොම්හ''

අ) මෙය ප්‍රකාශ කළේ කවුද ?

ආ) ප්‍රකාශ කළේ කාට ද ?

04) ''ගියොත් හුදෙක් අපට ම ලජ්ජාවන්නීය. ඔබ ගමන නොකමැත්තෙමි''

අ) මෙය ශ්‍රවණය කළ පුද්ගලයා කවුද ?

ආ) ඔහු එයට දුන් පිළිතුර කුමක්ද ?

05) ''යමක් මට රුචි වී නම් ඒ දෙන්නෙමි, කීයෙමි. දැන් මට යමක් රුචි වී නම් ඒ දෙමි.''

අ) මේ ප්‍රකාශ කළ තැනැත්තා ලබා ගත් උදව්ව කුමක්ද ?

ආ) ඔහු වඩාත් රුචි දෙය කුමක්ද ? (ලකුණු 10)

- පහතින් දක්වා ඇති වචනවල අරුත් පැහැදිලි කරන්න.

1. පුෂ්පදාමාවලම්බිත
2. විතානෝපලක්ෂිත
3. අභිමානපුරස්සර
4. දළ පුඩු සෙසත්
5. යමුගුරු
6. අන්තස්සර
7. කුරුබිලිය
8. ක්ෂෝභ
9. ශෘංගි
10. ගන්ධ දාම